
# 13 කුඹුරින් උපන් හැදියාව

ශ්‍රී ලාංකික ජන ජීවිතය, කුඹුර හා කමත මුල්කරගත් කෘෂි කර්මාන්තය සමග බැඳී පවතී. විශේෂයෙන් අපට උරුම වී ඇත්තේ කෙතෙන් උපන් හැදියාවකි. කුඹුරත්, කමතත් ආශ්‍රයෙන් බිහි වූ අපේ සංස්කෘතියේ හරය ගොවි සිරිත් විරිත්, පුද පූජා, ඇදහිලි, විශ්වාස, කෙම් පහන් ආදියෙහි ගැබ් වී තිබේ. වී ගොවිතැනින් පණ පෙවුණු ශ්‍රී ලාංකිකයෝ මහ සයුරු පරයන වැව් ද, වලා රැලි සිප ගන්නා කොත් කැරලි ඇති දාගැබ් ද, ලෝවාමහාපාය වැනි නවමහල් මන්දිර ද, සීගිරිය වැනි විස්මයජනක කලාගාර ද ගොඩනැගූහ. මේ සියලු හපන්කම් සඳහා ගොවිතැන ආශ්‍රයෙන් පන්නරය ලැබිණි. දේශීය වී ගොවිතැන හා බැඳුණු සංස්කෘතිය මේ පාඩමෙන් දිග හැරෙයි.

ලොව විශිෂ්ටතම සංස්කෘතියක් අපට උරුම වූයේ බුදු දහමින් ප්‍රභාවිත වූ කෘෂි සංස්කෘතියකට ශ්‍රී ලාංකිකයා යොමු වීම නිසා ය. වී ගොවිතැන දැහැමි රැකියාවකි. බුදු දහමේ අනුදත් **'සම්මා ආජීව'** හා **'සම්මා කම්මන්ත'** යන නිවැරදි ප්‍රතිපදාවලට එය අනුකූල වේ. මේ නිසා වී ගොවිතැන පදනම් කරගෙන මෙරට විශිෂ්ට සංස්කෘතියක් ගොඩනැගුණි.



වැව හා දාගැබ

දේශීය වී ගොවිතැන අර්ථවත් කරන '**කෙත**' හා '**කමත**' ශ්‍රී ලාංකික ගොවිජන සංස්කෘතියේ පදනම වෙයි. සකු බසින් '**ක්ෂේත්‍ර**' යනුවෙන් ද පාලි බසින් '**ඛෙත්ත**' හා '**කේදර**' වශයෙන් ද ද්‍රවිඩ බසින් '**වයල්**' යන්නෙන් ද සකස් වී සිංහල බසෙහි '**කෙත**' යන නමින් හැඳින්වෙන්නේ ද අපේ ජාතික මහා උරුමයක් වන කුඹුරයි. **වෙල, ලියැද්ද, උබර, කුඹුර, කොඹර, ඉස්සර, වගා ඉස්සර, වගා පංගුව** ආදි වශයෙන් අරුත්බර පර්යාය නාම වී ගොවිතැන් කෙරෙන බිමට යෙදේ. එසේ වී වගා බිම හැඳින්වීම පිණිස භාවිත කෙරෙන වදන්මාලාව දෙස බැලීමේ දී ඒ හා බැඳුණු සංස්කෘතියේ උදාරත්වය කෙතරම් දැයි සිතා ගත හැකි ය.

වැවත්, දගැබත්, සිංහල සංස්කෘතියේ සංකේතය යි. එම සංස්කෘතිය වඩාත් දීප්තිමත් වූයේ වී ගොවිතැනත්, බුදු දහමත් නිසා ය. මෙරට විස්මයජනක වාරි සංස්කෘතියක් බිහි වූයේ ද වගා සංස්කෘතිය නිසා ය. '**වැව**' දාගැබ හා සම්බන්ධ ය. වැව යම් තැනක ද දගැබ ද එතැන දිස් වේ.


රජරට පුරා ගොඩ නංවා ඇති වැව් ඉස්මත්තේ දිස්වෙන්නේ පාරිශුද්ධත්වයේ සංකේතය වූ දාගැබ් වහන්සේ ය. නිල්වන් දියෙන් පිරුණු වැව පවසන්නේ තමා කෙත් යායවල් පෝෂණය කිරීමට සැදී පැහැදී සිටින බවකි. ඊට ආශිර්වාදය බුදු දහමින් ලැබෙන බව දාගැබ් වහන්සේගෙන් තහවුරු වේ. මේ අනුව '**දාගැබ**', '**වැව**' හා '**කෙත් යාය**' යන උදරතර වස්තු අපේ සංස්කෘතියේ හැඩරුව පවසයි. වී ගොවිතැන් සිදු කෙරෙන කෙත් යාය පණ ලබන්නේ ජල සම්පතිනි. ඒ ජල සම්පත ගබඩා කර වී ගොවිතැන සඳහා ජීවය ලබා දීම පිණිස වාරි සංස්කෘතියක් ගොඩ නැංවිණි. වී ගොවිතැන ඇති නොවන්නට වාපි හා වාරි තාක්ෂණය ද මෙම සංස්කෘතිය ද ගොඩ නො නැංවෙනු ඇත. ලෝකයේ ඉහළ ම සංස්කෘතියක් අපට හිමි වූයේ ජලය වී ගොවිතැන හා අත්‍යන්ත ව ප්‍රතිබද්ධ වූ නිසා ය.

කුඹුරක් අස්වද්දා එහි බැත වී බිස්සේ, අටුවේ, කොටුවේ තැන්පත් කරන තෙක්, වී ගොවිතැන ආශ්‍රිත ව සුවිශේෂ වූ, සුවිශාල වූ, ශ්‍රම දායකත්වයක් අවශ්‍ය වේ. ඒ සඳහා ශ්‍රී ලංකාවාසීහු සමගිදමයකින් බැඳුණෝ ය. වී වගා සංස්කෘතිය ගොඩනැංවී ඇත්තේ පරාර්ථකාමී සංස්කෘතියක් පදනම් කොටගෙන ය. එහි සියලු කටයුතු සාමූහික ව සිදු කළ යුතු ආකාරයට සංවිධානය වී තිබේ. කෙතක් අස්වැද්දිය යුත්තේ එක ම දිනයක හෝ එක ම කාල පරාසයක් හෝ තුළදී ය. **මුල් හී, දෙහී හැමෙන්** පසු පෝරු ගා කෙත වපුළ යුත්තේ එක ම දින වකවානුවක ය. කෙත් යායකට යෙදිය යුත්තේ එක ම වර්ගයකට අයත් බිත්තර වී ය. ගොයම් කැපෙන්නේ එක ම වකවානුවකදී ය. කැපූ ගොයම් කඩිනමින් බැඳ ගත යුතු ය. ඒවා **කලවිටට** ගෙන යා යුතු ය. **ගොයම් කොළ** ගැසිය යුතු ය. රියක් පහන්වන තුරා ගොයම් මැඩවිය යුතු ය. ගොයම් සම්බන්ධ ඉදිරි කටයුතු ද එසේම ය. එහෙයින් වී ගොවිතැන සම්බන්ධ මේ හැම කාර්යයක් සඳහා ම සෑහෙන පිරිසකගේ ශ්‍රම දායකත්වයක් ලබා ගත යුතු ය. ස්ත්‍රී, පුරුෂ, ළමා, ළපටි සියලු දෙනාගේ සහාය ඒ සඳහා අවශ්‍ය වේ. මේ සඳහා කුඹුරු, ගොවියා යොදා ගත් අනගි උපක්‍රමයක් වූයේ '**ගොයම් කයියක්**' පැවැත්වීම ය. '**ගොයම් කයිය**' සිංහල ගොවි සංස්කෘතියේ

වටිනා ශ්‍රම දයකත්වයකි. වී ගොවිතැන සඳහා යොදා ගත යුතු වූ ශ්‍රම දයකත්වය උදෙසා කයියක් පැවැත්වීම විදේශිකයන් පවා විස්මයට පත්කළ අපූරු අගනා හෙළ සංස්කෘතිකාංගයකි. ගොයම් කයිය වී ගොවිතැනේ දී '**ගොයම් නෙළීම**' හා '**කැපීම**' යන අවස්ථාවල දී අතිශයින් ම වැදගත් විය. '**නෙළුම් කයිය**' '**ගොයම් කයිය**' යනුවෙන් එකී අවස්ථා හැඳින්වී ඇතත් සී සෑම, වැපිරීම හා පෑගීම යන අවස්ථා සඳහා '**කයිය**' යන වචනය එතරම් යොදන බවක් අසන්නට නොමැත. '**කයියක්**' පැවැත්වීමේ දී වී ගොවියා අනුගමනය කළ සිරිතක් විය. එනම් ගමට සේවාව සලසන වෙද මහතා, ගම මහතා, ගුරුතුමා, ඉඩම් හිමියා වැනි ප්‍රභූන්ගේ කුඹුරුවල කටයුතු මුළු ගම ම එකතු වී නොමිලයේ ඉටුකර දීමයි. ගමට පොදු සේවාවක් සලසන්නවුන් වෙනුවෙන් නොමිලයේ කයියකට සහභාගි වීමෙන් කෘතගුණ සැලකීමට තරම් ශ්‍රී ලාංකිකයෝ කෘතඥතාපූර්වක වූහ. සෙසු ගොවියන් අතර සාමූහික ව සිදුකර ගත යුතු වී වගාවට සම්බන්ධ සියලු ම කටයුතු සඳහා '**අත්තම් ක්‍රමයක්**' ක්‍රියාවට නැංවිණි. ගොවි කටයුතු සඳහා භාවිත කරන උපකරණ රාශියකි.

ගොයම් කයියක් සඳහා පිරිස කැඳවා ගත්තේ ආරාධනාවකිනි. පිරිමින් සහභාගි විය යුතු ගොවි කටයුතු සඳහා ආරාධනය ගොවියාගෙනි. කාන්තාවන් සහභාගි විය යුතු නෙළුම වැනි ගොවි කටයුතුවලට ආරාධනය ගෙවිලිය අතිනි.

කයියක් සඳහා අත්තමට එන මෙන් ගම්වාසීන්ට ආරාධනා කිරීම පිණිස සූදනම් වන ගොවියාට බුලත් කොළ 40කින් සමන්විත බුලත්අතක් ගෙවිලිය විසින් සූදනම්



**ගොවි කටයුතු සඳහා භාවිත කරන උපකරණ.**

කෙරේ. එය ද රැගෙන සවස් යාමයේ ගමේ නිවෙස්වලට ගොඩවදින ගොවියා **"හෙට මගේ කුඹුරේ ගොයම් කපනවා"** කියමින් බුලත් අත පිළිගන්වයි. ඊට සහභාගි විය හැකි නම් බුලත් කොළයක් ගැනීමත්, සහභාගි විය නො හැකි නම් බුලත් කොළයක් නො ගැනීමත් ගොවි සමාජයේ සිරිතකි. එසේ ගම පුරා කයියට ආරාධනය කර නිමවා නිවසට පැමිණෙන ගොවියා ඉතිරි ව ඇති බුලත් හුරුල්ල ආපහු ගෙවිලියට දෙයි. ඕ එය ගණන් කර බලා පසු දා කුඹුරේ පැවැත්වෙන කයියට පැමිණෙන සංඛ්‍යාව දැනගෙන ඔවුනට ඉතා රසවත් ලෙස ඇඹුල පිළියෙල කිරීමට සූදානම් වෙයි. ගොයම් කයිය සඳහා පැමිණෙන අයට දෙන ආහාරය උදෙසා භාවිත කළේ ද සුවිශේෂ වදන් මාලාවකි. එය **'ඇඹුල'**, **'කයිබත'**, **'මුත්තෙට්ටුව'**, **'වෑදම'** යන නම්වලින් හැඳින්වේ.

කෙතෙහි වගා කටයුතු ඇරඹෙන්නේ වප් මඟුල් උත්සවයක් පැවැත්වීමෙන් ය. වී ගොවිතැන හා බැඳි චාරිත්‍ර අතර රටේ රාජකීයයන් සහභාගි වන වප් මඟුල සුවිශේෂ අවස්ථාවකි. වප් මඟුල යනු සුබ දිනක සුබ හෝරාවකින් සුබ අතකින් කුඹුරු වැඩ ඇරඹීමේ උත්සවයයි.

වප් මඟුලට සමගාමී ව රටේ කුඹුරු යායවල ද මුල් හීය ගෙවදීම නැත්නම් මංගල හීය පිරීම තෙරුවන් හා දෙවියන් පිදීමෙන් අනතුරු ව සිදුකිරීම අපේ ගොවි සංස්කෘතියේ විශේෂ අවස්ථාවකි. කෙත් යායක **'මුල් හීය පිරීම'** පිණිස නායකත්වය ගන්නේ **'අත්වාසිය'** ඇති ගොවිරාල කෙනෙකි. පළමු ව ඔහුගේ **'හී හරක්'** බානට වියගහ බැඳ එහි අමුතු බානකින් නඟුල ගැට ගැසීම ගරු සරු ඇති ව සිදු කෙරෙයි. අත්වාසිය ඇත්තා කෙත් යාය ඉස්මත්තේ සිට පාමුල දක්වා සියලු ම ලියැදි දිගේ හී හරක් බාන දක්කමින් මුළු කුඹුරු යාය වටා රවුමක් හා ගෙන එයි. මේ චාරිත්‍රයෙන් කුඹුරු යාය පොදු සම්පතක්





නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සේ සැලකූ බව තහවුරු වෙයි. තම තමන්ට වෙන් වෙන් වූ කුඹුරු තිබුණ ද අප රටේ වී ගොවියෝ කිසි විටෙකත් අන්‍ය කුඹුරකට කිසිදු හානියක් නො කළෝ ය. එය ද තම කුඹුර සේ ම රැක්කාහ.

කුඹුරක සිදු කෙරෙන මුල් ම කටයුත්ත බින්නැගුම ය. රාජකීය වප් මඟුල් උත්සවයෙන් සිදු කෙරෙන්නේ ද එම කටයුත්ත ම ය. එය **බින්නැගුම, බින්හීය, බිම් හීය, පුරන් හීය, මුල් හීය** යන නම්වලින් ද හැඳින්වේ. බිම් හීය කුඹුරේ දික් අතට හෑම සිරිතකි. ඉන්පසු සිදු කෙරෙන දෙහීය හෙවත් මඩ හීය, අනතුරු ව කෙරෙන වප්හීය හා කුඹුරු වැපිරීම යන කටයුතු සිදු වන්නේ කෙත් යාය පූජනීය ස්ථානයක් සේ සලකා බොහෝ ගරුසරු ඇතිව ම ය. කුඹුරේ සිදු කෙරෙන සෑම කටයුත්තක ම ආරම්භය සුබ දිනක, සුබ හෝරාවකින්, නමස්කාරයකින් අනතුරු ව සිදු කිරීම අපේ වී ගොවිතැන් සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණයකි. එසේ ම කුඹුර හා කමත සම්බන්ධ ව සිදු කෙරෙන බොහෝ ගොවි කටයුතු උත්සවශ්‍රීයෙන් යුතු ව සිදු කිරීම ද වී ගොවි සංස්කෘතියේ ලක්ෂණයකි.

ගොයම් කැපීම සඳහා භාවිත කළ තාල කැපුම. එහි දී වාදනය කළ උඩැක්කි, ගැටබෙර හා බුම්මැඩිය යන වාද්‍ය භාණ්ඩ දෙස බැලීමේ දී එම 'උත්සවශ්‍රීය' පිළිබඳ චිත්ත රූපයක් මවා ගත හැකි ය.

වී අස්වැන්න ගෙට ගැනීමෙන් පසු ව මුලින් ම සිදු කෙරෙන අලුත් සහල් පූජාව **'අලුත් සහල් මංගල්‍යය'** වශයෙන් නම් කෙරේ. ශ්‍රී දළඳ මාළිගාව, අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය, කතරගම කිරිවෙහෙර වැනි බෞද්ධයාගේ අතිපූජනීය ස්ථානවල තෙරුවන් උදෙසා සිදු කෙරෙන අලුත් සහල් පූජාව අපේ සංස්කෘතියේ උදාරත්වය වැඩි දුරටත් විදහා දක්වයි. හැම විටෙක ම හෙළයා තම අග්‍රශස්‍ය බුදුරදුන්ටත්, දෙවියන්ටත් පූජා කිරීමෙන් දානමය පුණ්‍ය චේතනා වර්ධනය කර ගැනීමට තරම් පින්බර වීය.

අලුත් සහලෙන් විහාරස්ථානයට දන් වේලක් පිරිනැමීම ද, දෙමාපියන් ඇතුළු වැඩිහිටියන්ට අලුත් බත් වේලකින් සංග්‍රහ කිරීම ද ගොවි චාරිත්‍රයකි. ගමේ දේවාලය ද අමතක නො කරන හෙළ ගොවියා එහි මංගල්‍යය උදෙසා අලුත් වී වෙන්කරයි. දෙවියන් වී ඉඳුල් කිරීම සංකේතවත් කරමින් ගමේ දේවාලයේ කපු මහතා නිවෙසට කැඳවා දෙවියන් වැඳ, අලුත් වී ඉඳුල් කිරීම සිදු කෙරෙයි. එකල නිවෙස්වල අලුත් වී ඉඳුල් කෙරෙන තුරු නිවසේ පිටි කෙටීමක් සිදු නො විණි.

වී ගොවිතැන ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති භාෂාව දේශීය සංස්කෘතියේ සුවිශේෂී පැතිකඩකි. වී ගොවියා කෙතේ දී, කමතේ දී වහරන්නේ ඊට ම සුවිශේෂී වූ වදන් මාලාවකි.

- කන්නයක් වගා කිරීම සඳහා මංගල දියවර හැරවීම **'වප්පැන'** යනුවෙන් ව්‍යවහාර වෙයි.

- කුඹුරේ පළමු වන හීය '**බිම්නැගීම**' වේ. එය උදැල්ලකින් සිදු කරන්නේ නම් '**පුරන් කෙටීම**' බවට පත්වේ. '**දෙහීය**' වන්නේ කුඹුර දෙවන වරට හෑමයි. කුඹුරේ තුන් වන හීය '**වප් හීය, මඩ හීය, ඇද්දුම, දිග ඇද්දුම**' වශයෙන් නම් කෙරේ.
- කුඹුරේ ඉසීමට ගන්නේ බිත්තර වී ය. එය ජලයෙන් පෙඟවීම '**වී දියේ දැමීම**'යි.
- දියෙන් ගත් බිත්තර වී පැළවීම සඳහා ගොඩ ගැසීම '**වී යහන් කිරීම**' වශයෙන් හැඳින් වේ. වී යහනේ මුල් ඇදුණු වී කුට්ටි කඩා ඉසිරීමට සුදුසු ලෙස සකස් කිරීම '**වී අත්ලැසීම**' යි.
- '**පුරවැඩුම**' වශයෙන් හැඳින්වෙන්නේ කෙතක මංගල බීජ රෝපණය කිරීම යි.
- වී වැපිරීමේ දී කුරුලු කොබෙයියන් වෙනුවෙන් වෙන් කරන '**කනටිය**', '**කුරුලු පාළුව**' නම් වේ.
- කෙතේ වී ඉසීම '**කුඹුරු වැපිරීම**'යි.
- එසේ වැපුරූ කුඹුරු දියෙන් තෙත් කිරීමේ ක්‍රමය '**ඉස්නන් බැඳීම**' යි.
- කුඹුරේ වල් පැළ ගැලවීම '**නිද්දානය**' නම් වේ. '**නෙළුම් ඇල්ලීම**' යනුවෙන් ව්‍යවහාර කෙරෙන්නේ ද එම කටයුත්ත ම ය.
- ගොයම් ළාබාල අවස්ථාව '**ගොයම් පැළපත**' යි. එහි දී කොළ මහත් වීම '**ගොයම් බණ්ඩි වීමකි**'. වී කරල් මතු වීම '**ගොයම් පීදීම**' යනුවෙන් ද වී ඇට පිරී ඒම '**ගොයම් කිරි වැදීම**' වශයෙන් ද ගොවියෝ හඳුන්වති.
- කුඹුරේ හෑමට යොදවන්නේ '**හී හරකුන්** ' ය. හී හරක් බානේ කර මත තබන්නේ '**වියගහකි**'. සී සෑම සඳහා නගුලට වියගහ සම්බන්ධ වන්නේ '**අමුතු බාන්**' වලිනි. කුඹුරේ හී සෑමට '**හී කෙවිට**' ද නැතු ව ම බැරි ය.

කුඹුරේ කැපූ ගොයම් පාගන කමත '**කලවිට**' වශයෙන් හැඳින්වේ. කලවිටේ දී භාවිත කෙරෙන විශේෂ ව්‍යවහාර රැසක් ම වෙයි. කමත පිළියෙල කිරීම '**කමත කැපීම**'යි. **කමතඃ කමත් වැටිය, ගොන්මෝල් කඩ, අරක්වළ, ඇළිමෝල් කඩ, ඇළ** යන අංගවලින් යුක්ත ය. කමත මැද ආරක්ෂාව සඳහා තනන්නේ '**අරක් වළකි**'. ගොයම් පෑගීමට පෙර කමත අළුවලින් සටහන් කිරීම '**අළුහන් වැඩීම**'යි. කමතට ගොයම් දැමීම සඳහා '**උප්පිඩ තැබීම**', '**ගොයම් බෑම**', '**මිටිය බෑම**', '**කොළ එළීම**', '**කොළ වැඩම වීම**' යන ව්‍යවහාර පවතී. මීහරකුන්ගෙන් කොළ පෑගීම '**කොළගොන් ගැසීම**'ය. ගොයම් පෑගීමට යොදන මීහරකා '**අම්බරුවා**'ය. කොළ පෑගවීම සඳහා අම්බරුවන් එකට සම්බන්ධ කිරීම '**අම්බරුවන් කැරැල්ල**' නම් වේ. අම්බරුවන් කැරැල්ල කමත මැද කොළ මැඩවීමට රඳවන්නේ '**ගොන් කණුවක**' ය. එය '**කම්බා කණුව**, '**මුත්තා කණුව**', '**කොළ කණුව**' වශයෙන් ද ගොවියෝ හඳුන්වති. කොළ මඬවන අම්බරු නායකයා '**මුදුනා**'ය. ඊළඟට ඇඳන්නේ '**කොළ මුත්තා**'ය. ඊළඟ අම්බරුවා '**දැතුරයා**'ය. අනතුරු ව ඇඳින්නේ '**මට්ටයා**'ය. අවසානයට යොදන්නා '**කලාතයා**'ය. කමතේ සිදුවන සියලු කටයුතු '**ගොයිකම්**' වශයෙන් නම් කෙරේ. කොළ පෑගී ඉතිරිවන පිදුරු '**මැඩුවන්**' වන අතර ගොයමින් බේරෙන වී '**බැත**' නමින් හැඳින්වේ. කමතට ගෙනෙන ඇඹුල '**පුබ්බරු**' වශයෙන් නම් කෙරේ.

ආහාර අනුභවය, **'කොටා බෑම'** නමින් හැඳින්වේ. මේ හැර **'කමත් භාෂාව'** වශයෙන් ඉදිරිපත් කළ හැකි තවත් වදන් රැසකි. කමතේ භාවිත කෙරෙන **'දැති ගොයියා'** **'බෝලත්ත'**, **'කටුමානා'**, **'පෝරු ගොයියාව'**, **'යතුර'**, **'කටුපන'**, **'මාගල'**, **'ලාහ'**, **'ඉස් මල්ල'** වැනි අපේ සංස්කෘතියට උරුම වූ උපකරණ රැසක් ම වෙයි.

වී ගොවිතැනට සිවුපා සතුන්ගෙන්, පක්ෂීන්ගෙන් හා විවිධ කෘමීන්ගෙන් හානි සිදුවුව ද වී ගොවියා කිසිවිටෙකත් ඒ හානි වළක්වාලීම සඳහා සත්ත්ව ඝාතනය නොකෙළේ ය. සතුන් පලවාහැරීම සඳහා රෑ නිදිවරමින්, පැල් කවි කියමින් පැල් රැකීම ගොවි චාරිත්‍රයක් කරගත්තේ ය. ඒ හැර පරිසරයේ ඇති රඹුක්, මඩු, කිතුල්, කැප්පෙටියා, කරඳ, කුඩු දවුල වැනි ශාක අතු කෙතේ සිටුවා කෘමි උවදුරු වළක්වා ගත්තේ ය. සතුන් මිය නො යන ශාක පත්‍රවල යුෂ කුඹුරට ඉස්සේ ය. අළු, වැලි, ගල් වැනි දේ පිරිත් කර කුඹුරට යෙදුවේ ය. රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය හා මංගල සූත්‍රය උපයෝගි කරගෙන කෙත් යාය ආරක්ෂා කර ගැනීමට තරම් අපේ ආදි වී ගොවීහු දැහැමි වූහ. කෙම් ක්‍රමයෙන් ප්‍රතිකාර සැලසීම අපේ සංස්කෘතියේ සාරවත් භාවය පළ කරන්නකි. අපේ මුතුන්මිත්තෝ වගා බිම පූජනීය ස්ථානයක් ලෙස සැලකූහ. **'ගොවියා දෙවියා'**ය යන වහර ද **'මඩ සෝදගත් කල ගොවියා රජකමට ද සුදුසු ය'** යන වහර ද ඒ විශ්වාසය හා බැඳී පවතී. දේශීය වී ගොවිතැන මුල් කර ගෙන සකස් වූ අපේ සංස්කෘතියත්, ඒ හා බැඳුණු සාරධර්මත් ශ්‍රී ලාංකේය හර පද්ධතියේ මහිමය මූර්තිමත් කරයි. දිනෙන් දින සිදු වන නවීකරණය හමුවේ ශ්‍රී ලාංකිකයාට නො සැලී සිටීමට හැකි ශක්තියක් ඇති වී තිබේ නම් එසේ සිදු වී ඇත්තේ මෙරට කෙත, කමත යන සංස්කෘතික තෝතැන්නෙන් ලත් ජීවය නිසා ය.

අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| අත්තම | - | අත් උදව්ව/ කෙනකුගේ වැඩකට තව කෙනකුගේ උදවුව |
| අත්වාසිය | - | වාසනාව |
| අත්‍යන්ත ව | - | අතරක් නොමැති ව |
| අමුතුබාන | - | හී වැල/ සීසෑමේ දී සහ පෝරු ගෑමේ දී නගුල සහ පෝරුව වියගහට ස්ම්බන්ධ කිරීම සඳහා භාවිත කරනු ලබන පට්ටා විශේෂය. |
| අරක්වළ | - | කමතේ ආරක්ෂක වස්තු බහාලන වළ |
| අරුත් වියකන් | - | තේරුම් හා ඒවායේ විස්තරාර්ථ |
| මෝල්කඩ | - | කමතට පිවිසෙන, පිටවන දොරටුව |
| ඇළිමෝල්කඩ | - | කමතේ අරක්වළේ සිට කමත් ගැට්ටෙන් පිටතට කෙළින් දමන කාණුව |
| කටුපන | - | වී දමන මල්ල |
| කටුවාන | - | බැතවල කාටුව ඉවත් කිරීමට ඉපල් අතුවලින් බැඳ ගන්නා ආධාරකය |

| | | |
|---|---|---|
| කනටිය | - | කුඹුරේ කෙළවර පිහිටි අසාරවත් කුඩා ලියද්ද |
| කමත | - | ගොයම් පෑගීම සඳහා සකස් කළ බිම |
| කමත් වැටිය | - | කමතේ අවසාන සීමාව |
| කුඹුර | - | වී ගොවිතැන සඳහා නියරවල් බැඳ සකස්කොට ගන්නා බිම් කොටස/කෙත |
| කෙම් පහන් | - | කෙම් කිරීම්, පහන් තැබීම් ආදී විශ්වාස පදනම් වූ පූජාවිධි |
| කොළ ගැසීම | - | ගොයම් ගොඩ ගැසීම/ගොයම් කොළය |
| ගොන් මෝල්කඩ | | කමතට අම්බරුවන් ඇතුළු කරන දෙරටුව/කමතට පිවිසෙන දෙරටුව |
| දූතිගොයියා | - | ගොයම් හැලීම සඳහා පිළියෙල කරගන්නා කරුවක් සහිත රිට |
| නිරුක්ති | - | විස්තරාර්ථ |
| පෝරුගොයියාව | - | කමතේ බැත රාශි කිරීමට ගන්නා ලීයෙන් තැනූ උපකරණය |
| බෝලත්ත | - | කමත ඇමදීමට ගන්නා ඉපල |
| මාගල | - | තල් කොළවලින් වියූ විශාල පැදුර |
| යතුර | - | කුඩා කුල්ල |
| වියගහ | - | නගුල හෝ පෝරුව ගවයන්ගේ කරේ රඳවන ආධාරකය |

## ක්‍රියාකාරකම 01



**පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු කණ්ඩායම් වශයෙන් ප්‍රකාශ කරන්න.**

(i) ශ්‍රී ලාංකික සංස්කෘතියේ පදනම වන්නේ කුමක් ද?

(ii) 'දගැබ', 'වැව' හා 'කෙත් යාය' රටේ සංස්කෘතිය විදහා පාන්නේ කෙසේ ද?

(iii) 'ශ්‍රමය ධනයකි' යන ආප්තයට මෙරට වී ගොවිතැන් සංස්කෘතියෙන් ඉදිරිපත් කළ හැකි නිදසුන් මොනවා ද?

(iv) වී ගොවිතැනේ දී ක්‍රියාත්මක වූ අත්තම් ක්‍රමයෙන් අපේ සංස්කෘතියේ ලක්ෂණ ඉස්මතු වන තැන් ඉදිරිපත් කරන්න.

(v) 'කෙත හා කමත ගොවියාට පූජනීය වේ.' ඒ බව කවර ගොවි ක්‍රියාකාරකම්වලින් තහවුරු වේ ද?

(vi) කුඹුරින් උපන් භාෂා ව්‍යවහාර මගින් දේශීය අනන්‍යතාව හෙළි කරන්නේ කෙසේ ද?



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 02

1. පන්තිය කණ්ඩායම් වශයෙන් බෙදී පහත දී ඇති එක් එක් මාතෘකාවට නිවැරදි අයුරින් ම අදාළ ඡේද කොටස් හෝ වැකි හෝ පාඨමෙන් තෝරා ගෙන පන්තිය ඉදිරියේ ප්‍රකාශ කරන්න.

    (i) 'සිංහල සංස්කෘතියේ පදනම වී වගාව යි'
    (ii) 'බෞද්ධ ඉගැන්වීම් සිංහලයාගේ ආකල්ප සකස් වීමෙහි ඉවහල් විය'
    (iii) 'වී ගොවිතැන සඳහා සාමූහික ශ්‍රම දයකත්වයක් ලැබිණි'

2. දේශීය වී ගොවිතැන හා බැඳුණු සංස්කෘතිය මේ ඡේද හා පද්‍ය කොටස්වලින් තෝරාගෙන අගය කරන්න.

(අ) ලංකාවේ ගොවියෝ ගොයම් කැපීමෙහි දක්ෂයෝ ය. ගොයම් කැපීමේ දී මුළු ගමේ ම ගොවියෝ සාමූහික ව වැඩ කරති. එක් එක් ගොවියෙකුගේ කුඹුරේ ගොයම් කැපීමට ගමේ සියලු දෙනා ම පැමිණෙති. වෙල් යායේ ම ගොයම් කැපී අවසන් වන තුරු ගමේ ගොවියෝ සාමූහික ව වැඩ කරමින් ගොයම් කපති. යම් ගොවියෙකුගේ කුඹුරක ගොයම් කපන්නේ නම් එම කුඹුරු හිමි ගොවියා එහි ගොයම් කපන්නට පැමිණි සියලු දෙනාට ම බත බුලත සම්පාදනය කරන්නේ ය. කපන ලද ගොයම එක්කොට බැඳ, බඳින ලද ගොයම් මිටි එක් තැනකට ගෙන යෑම ගැහැනුන් සතු වැඩක් වන්නේ ය.

(එද හෙළදිව - 68 පිටුව - රොබට්නොක්ස්)

(ආ)

**රැනින් රැන උඩ ඉගිළෙන කුරුල්ල නේ**
**බානින් බාන ගල් ගැහුවත් නොයන් නේ**
**පුංචි කටින් කුරු වී ගෙඩි තළන් නේ**
**මෙදා යලේ ණය නොකරවි කුරුල්ල නේ**

**පේවී පිරුවට ඉස් සෝදා ගෙන**
**මාවී අටුවෙන් බාලා අර ගෙන**
**ඒවී දිය ලාමින් සිට සැම දින**
**පේවී තුන් දින හැරලා බලමින**

(ජනකවි)

## ක්‍රියාකාරකම 03

**වී ගොවිතැන් සංස්කෘතියේ දී භාවිත කෙරෙන ව්‍යවහාරය වරහනින් තෝරා හිස් තැන් පුරවන්න.**

(i) කෙතක මංගල බීජ රෝපණය .................................. නමින් හැඳින්වේ.
(ii) වැපුරූ කුඹුර දියෙන් තෙත් කිරීමේ ක්‍රමය .................................. යි.
(iii) කුඹුරක ..................................... නම් ලියැද්දක් වැපිරෙන්නේ කුරුලු කොබෙයියන් සඳහා ය.
(iv) ගොයමේ වී කරල් මතුවීම .................................. යනුවෙන් හැඳින්වේ.
(v) කුඹුරේ වල් පැළ නැග එන කල .................................. කළ යුතු වේ.
(vi) ගොයම් පැගීමට පෙර කමත අළුවලින් සටහන් කිරීම ............................... යි.
(vii) කෙතේ පැහුණු ගොයම් කැපීම සඳහා .................................. යොදා ගැනීම ගොවියාගේ සිරිත යි.
(viii) කමත මැද ආරක්ෂාව සඳහා තනන්නේ ...................................... .

(ඉස්නන් බැඳීම, ගොයම් කයියක්, ගොයම් පීදීම, පුරවැඩුම, අළුහන් වැඩීම, කුරුලු පාළුව, නෙළුම් ඇල්ලීම, අරක්වළකි)

## ක්‍රියාකාරකම 04

**නිපාත පද**

නාම, ක්‍රියා, උපසර්ග, නිපාත වශයෙන් සිංහල භාෂාවේ ව්‍යවහාර කෙරෙන පද පිළිබඳ ව ඔබ මීට පෙර ඉගෙන ගන්නට ඇත. මෙහි දී '**නිපාත පද**' පිළිබඳ ව වැඩි දුර කරුණු අධ්‍යයනය කිරීම සඳහා මෙහි ඉදිරිපත් කොට ඇති වාක්‍යවල යටින් ඉරි ඇඳි පද සැලකිල්ලට ගන්න.

(i) <u>**ඉතා**</u> ඈත කාලයක පවා වී ගොවිතැන පැවතිණි.
(ii) වාපිය, දාගැබ <u>**හා**</u> සහ සම්බන්ධ ය.

ඉහත දැක්වෙන වැකිවල යටින් ඉරි ඇඳි පද වෙනසකට පත් නො වේ. ඒවා ප්‍රකෘතියෙන් ම පවතින තනි පද වේ. මෙහි විශේෂය වන්නේ නාම, ක්‍රියා ආදි පද සමග යෙදී අර්ථය ප්‍රකාශ කිරීමයි. වාක්‍යයක මුල මැද අග යන කවර තැනක වුව ද යෙදේ.

මෙහි මුලින් ම දැක්වෙන '<u>**ඉතා**</u>' යන්න ඒකවචන, බහුවචන වශයෙන් වර නො නැගේ. මෙසේ භාෂාවේ වෙනස් නොවන පද නිසා මේවා අව්‍යය පද නමින් පද හැඳින්වේ. මේ අව්‍යය පද නිපාත හා උපසර්ග වශයෙන් දෙකොටසකි.

මුල් ම වැකියේ '**ඉතා**' යන නිපාත පදය බහුල බව ප්‍රකාශ කිරීම සඳහා භාවිත කෙරේ. එය භාෂාවේ දී බහුලාර්ථයේ නිපාත පද වශයෙන් නම් කෙරේ. **බොහෝ, හුග, ඉබොහෝ,** වැනි නිපාත පද ද මේ සඳහා භාවිත කෙරේ.

දෙවන වැකියේ '**හා**' යන නිපාතය පද සම්බන්ධ කිරීමේ හා කැටි කිරීමේ නිපාතයකි. පද සම්බන්ධ කිරීම සඳහා '**ත්**', '**සහ**', '**හා**', '**ද**' යන නිපාත පද ද යෙදේ.

**පහත දැක්වෙන නිපාත පද ද භාෂාවේ බහුල වශයෙන් යෙදී අර්ථ ප්‍රකාශ කරයි.**

| | | | | |
|---|---|---|---|---|
| ඛේදාර්ථය | - | (ශෝකය ප්‍රකාශ කිරීම) | - | අනේ, අහෝ, අයියෝ, අපෝ |
| විස්මයාර්ථය | - | (පුදුමය ප්‍රකාශ කිරීම) | - | හා, අහා, ආ, ඔහෝ |
| කාලාර්ථය | - | (කාලය හැඟවීම) | - | දැන්, යළි, නිති, නිතොර, නැවත |
| සීමාර්ථය | - | (සීමාව හැඟවීම) | - | තෙක්, දක්වා, තුරු, පටන්, සිට |
| සමාප්තිය | - | (වාක්‍ය සමාප්තියෙහි) | - | ඉ, ය, යි, යැ |
| ප්‍රශ්නාර්ථය | - | (ප්‍රශ්න ඇසීමේ දී) | - | ද, ඇයි, කුමක්, මන්ද |
| විකල්පාර්ථය | - | (පද සංසන්සනයේ දී) | - | හෝ, හොත, නොහොත් හෙවත් |
| ශ්‍රැති සූචනාර්ථය | - | (ඇසූ දෙය නැවත කීමේ දී) | - | ල, ලු |
| වාක්‍ය අලංකාර කිරීමේ දී | - | | - | වූ කලි, වනාහි |
| උපමා/තුල්‍යාර්ථයෙහි | - | (උපමා වාචී) | - | මෙන්, සේ, වැනි, බඳු, අයුරු |

මේ හැර **අරබයා, ඇතුළු, ඉතින්, ඉඳුරා, උදෙසා, එහෙත්, ඔස්සේ, ගැන, තකා, නමුත්, නම්, නැවත, නිතර, නිසා, පමණ, පාහේ, පාසා, බැගින්, සඳහා, හට, හුදෙක්, එම්බල** වැනි නිපාත පද රාශියක් සිංහල භාෂාවේ භාවිත වේ.

1. මේ වාක්‍යවල යෙදී ඇති නිපාත පද උපුටා ඉදිරිපත් කරන්න.

(i) ගවයා වනාහි ක්ෂීරපායී ගණයේ සතෙකි.

(ii) අපේ අරමුණ විය යුත්තේ හුදෙක් රට රැකීම ය.

(iii) මගේ ඉල්ලීම නැවත සලකා බලන්න.

(iv) ගමක් පාසා විදුලිය ලබා දී ඇත.

(v) වී ගොවිතැන යනු දැහැමි රැකියාවකි.

2. වරහනින් සුදුසු නිපාත පදය තෝරා ගෙන පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) හමු වූ මැණික .......................... අධික මිලකට විකුණාගත හැකි විය.
(ii) ගොවියෝ කුඹුරු පෝරු ගෑම .......................... වී වැපිරීම එක ම දින සිදු කරති.
(iii) හදිසි අවශ්‍යතාවක් .......................... මට අද ගමට යාමට සිදු විය.
(iv) ඇගේ නෙත් සඟල නිලුපුල් පත් දෙකක් .......................... පැහැබර ය.
(v) කුරුල්ලන් .......................... කා දමන ලද කුරුළු පාළුව කුඩා කනටියකි.
(vi) අසරණ සතුන් .......................... කරුණාව පතුරවමු.
(vii) ගොයම් නෙළූ කුඹුරේ වල් පැළ දක්නට ..........................වීය.
(viii) ලංකාවේ .......................... දෙනා බත් ආහාරයට ගනිති.
(ix) කෘෂි උපදේශකයන් පැවසූ .......................... ගොවියෝ කුඹුරු සැකසූහ.
(x) කුඹුරු වැපිරීමේ දී වී ඉසීම .......................... වී තවාන් දැමීම සිදු කෙරේ.

(නො, ම, සේ, නිසා, හෝ, විසින්, කෙරෙහි, බොහෝ, ඉතා, හා, අයුරු)

## ක්‍රියාකාරකම 05

(i) අපේ ගොවි සිරිත් යන මැයෙන් ලිපියක් සම්පාදනය කර පන්තිය ඉදිරියේ කියවන්න.

(ii) ගොයම් කැපීම, ගොයම් නෙළීම, ගොයම් මැඩවීම යන අවස්ථාවලින් එක් අවස්ථාවක් තෝරා ගෙන ඊට කථනය හා ගායනය ද ඇතුළත් වන සේ රංගනයක් ඉදිරිපත් කරන්න.